# තොරතුරු දැනගැනීමේ අයිතිය

## නිතර අසන ප්‍රශ්න කිහිපයක්
## (FAQ)



## මේ අබලන් මාර්ග නිසා මගේ අලුත්වැඩියා කිරීමේ ගාස්තුව ගෙවන්නේ කවුද?



ප්‍රඃ වළේ වැටී අබලන් වන මගේ ත්‍රී රෝධ රථය ගමන්ගන්නා මගේ නගරයේ මාර්ගය ප්‍රතිසංස්කරනය කිරීම සඳහා වෙන් කළ මුදලට සිදු වූයේ කුමක්දැයි ප්‍රශ්න කිරීමට මට අයිතියක් තිබේද?

පිඃ ඔව්. මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොපමණ මුදලක් වැය වූවේදැයි ප්‍රශ්න කිරීමට ඔබට අයිතියක් ඇත. එමෙන්ම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා විදේශ මුදල් ලබාගත්තේනම් ඒ සඳහා සැබවින්ම වැයවූ මුදල කොපමණදැයි විමසීමට ද ඔබට අයිතියක් ඇත. මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොපමණ පිරිසකට වැටුප් ගෙව්වේද, අමු ද්‍රව්‍ය සඳහා කොපමණ මුදලක් වැය වූවේද, ඔබේ මුදලින් කොපමණ මුදලක් මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කළේද කොන්ත්‍රාත්කරුගේ සාක්කුවට ගිය මුදල කොපමණදැයි ඔබට දැනගත හැක.

## විදුහල්පති මුණගැසීම සඳහා මම කොපමණ වෙලාවක් බලා සිටියයුතුද?




ප්‍රඃ මාගේ දරුවා රජයේ පාසලට ඇතුළත් කර නොගත්තේ මන්දැයි ප්‍රශ්න කිරීමට මට අයිතියක් තිබේද?

පිඃ ඔව්. ඔබ බදු ගෙවන්නෙක් වශයෙන් පාසල් ළමුන්ට දෙන පහසුකම්, ගුරුවරුන්ට ගෙවන වැටුප්, පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබා දීමට යන කොන්තරාත්තුව වැනි කාරණා පිළිබඳව පවා ඔබට විස්තර අසා දැනගැනීමට අයිතියක් ඇත.

## තාවකාලික මගී පාළමේ වැඩ ආරම්භ කිරීමට මා වැටෙනතුරු බලාසිටින්නේද?



ප්‍රඃ මගේ ගමට සුදුසු පාළමක් සෑදීම සඳහා නොවැම්බර් මාසයේ අනුමත කළ මුදල්වලට සිදුවූයේ කුමක්දැයි ප්‍රාදේශීය සභාවෙන් ප්‍රශ්න කිරීමට මට හැකියාව තිබේද?

පිඃ ඔව්. ඔබේ දෙපලවලින්/ව්‍යාපාරයෙන් බදු අයකරනවා ඔබ මිලට ගන්න සබන් සහ දත් බෙහෙත් ආදියෙන් ඔබ වක්‍රාකාරයෙන් බදු ගෙවන බැවින් ඔබට ප්‍රශ්න කිරීමේ අයිතියක් ඇත. කම්කරුවන් සහ අමුද්‍රව්‍ය සඳහා වෙන්කර ඇති මුදල, කොන්ත්‍රාත්තු කාලය පිළිබඳව ප්‍රශ්න කිරීමට පවා ඔබට අයිතියක් ඇත. කොන්ත්‍රාත්කරු කවුරුන්ද පිළිබඳව මෙන්ම කොන්ත්‍රාත්කරු වැඩ ආරම්භ කර නොමැතිනම් ඒ ඇයි යන්න පිළිබඳවද ඔබට ප්‍රශ්න කළ හැකිය.

# වෛද්‍ය ප්‍රතිකාර ගැනීම සඳහා කීලෝමීටර් කීයක දුරක් ගමන් කළ යුතුද




ප්‍රශ්: මහා කාහල නාදයක් මැද්දේ ඔබේ ගමේ පුංචි රෝහලකට සෞඛ්‍ය ඇමතිවරයා ඇතුළු නිලධාරීන් ගණනාවක් පැමිණ ඔබේ ගමේ මුල්ගල් තැබුහ. අත්තිවාරම දමා තිබියදී හදිසියේ පැමිණි මැතිවරණයක් නිසා එහි වැඩ නතරවිය. ඒ සඳහා අමාත්‍යාංශයෙන් කොපමණ මුදලක් වෙන් කර තිබේද කොන්ත්‍රාත්කරු කවුද යනුවෙන් ප්‍රශ්න කර දැනගැනීමේ  අයිතියක් මට තිබේද? ඒ සඳහා කොපමණ මුදලක් වියදම් ව තිබේද? ඉතුරු මුදල කොපමණද ආදී වශයෙන් තොරතුරු දැනගැනීමේ හැකියාවක් මට තිබේද ?

පි: ඔව්, ඔබට හැකියාව ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හෝ රජයේ ඊට අදාළ ප්‍රාදේශීය ආයතනයෙන් එම ව්‍යාපෘතිය පිළිබඳ ඔබ ඉල්ලා සිටින සියලු තොරතුරු නියමිත කාලයක දී දීමට ඔවුහු බැඳී සිටිති. නැතහොත් එම තොරතුරු ඔබට වෙනත් ආයතනයකින් ලබාගත හැක. එම තොරතුරු නොදුන් නිලධාරියාට එරෙහිව ක්‍රියාකළහැකිය.




ප්‍ර: ගොවිතැනට අවශ්‍ය ජලය හැරවීමට ඇළ මාර්ගයක් ඇති කිරීම පිණිස පාර්ලිමේන්තුවෙන් මුදල් වෙන්කර ඇත.

පි: ඒ සඳහා කොපමණ මුදලක් වැය කළේද එම මුදල් වලට සිදුවූයේ කිමෙක් ද? යන්න ප්‍රශ්න කිරීමට ඔබට අයිතියක් ඇත.




කෆීර්

පි: එවැනි කාරණා ජාතික ආරක්ෂාවට අදාළ බැවින් ඔබට එවන් ප්‍රශ්න ඇසිය නොහැක.

**පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රශ්න තොරතුරු දැනගැනීමේ අයිතියට යටත් නොවේ.**

- රටට, රාජ්‍ය ආරක්‍ෂාවට භෞමික අඛණ්ඩතාවයට, ජාතික ඒකාග්‍රතාවයට හෝ ජාතික ආරක්ෂාවට හානිවන බරපතල හානි සිදුවීම.
- ශ්‍රී ලංකාව සහ ඕනෑම රාජ්‍යක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් සමඟ පවත්නා සබධතා අගතියට හෙළීම.
- විදේශ මුදල් ගනුදෙනු හෝ එතෙර රට සල්ලි ගනුදෙණු පාළනය.
- ණය හෝ බැංකු රෙගුලාසි
- බදු
- භාණ්ඩ හා සේවා ස්ථාවරත්වය පාලනය, ගැළපීම්, කුලී සහ වෙනත් වියදම් වැටුප් ක්‍රම පඩි නඩි හා වෙනත් අදායම්.
- රාජ්‍ය ණය
- විදේශ වෙළඳ ගිවිසුම්
- ඕනෑම පුද්ගලයෙකු හෝ වාණිජ කටයුතුවලදී හානි විය හැකි වැළඳ රහස්.
- යම් පුද්ගලයෙකුගේ වෛද්‍ය වාර්තා.
- අපරාධ සම්බන්ධයෙන් සිදු කරන පරීක්ෂණයන්ට අදාළ අත්අඩංගුවට ගැනීම්, රඳවා තබාගැනීම් සහ අධිකරණ කටයුතුවලට බාධාවන ආකාරයෙන් කටයුතු කිරීම
- නීතිය බලගැන්වීම හා රාජ්‍යාරක්‍ෂාවට අදාළ රහස්‍ය තෝරතුරු.
- තෙවනි පාර්ශවයන් රාජ්‍ය ආයතන වෙත සැපයෙන රහස්‍ය තොරතුරු.

**ආර්.ටී.අයි. හෙවත් තොරතුරු දැනගැනීමේ අයිතිය යනු කුමක්ද?**

ආර් ටී අයි යන්නේ තේරුම නම් තොරතුරු දැනගැනීමේ අයිතිය යන්නයි. සියලුම පුරවැසියන් කිසියම් හෝ දෙයක් සඳහා රජයට බදු ගෙවන බැවින් එම මුදල්වලට සිදුවන්නේ කුමක්දැයි දැනගැනීමට ඔවුන්ට අයිතියක් ඇත. මුදල්වලට සිදුවන්නේ කුමක්ද, වියදම් කීයද, ව්‍යාපෘතියේ ප්‍රතිඵලය...ආදි වශයෙන් විස්තර දැනගැනීමට පුරවැසියන්ට තිබෙන අයිතිය තොරතුරු දැනගැනීමේ අයිතිය වශයෙන් සරලව හැඳින්විය හැකිය. පුරවැසියකු වශයෙන් ඔබගේ රහසිගතභාවය ආරක්ෂා වන අයුරින් රජයේ තොරතුරු ලබාගැනීමට ඔබට තිබෙන අයිතිය අනුව එම තොරතුරු ලබාදිය යුතුය. පුරවැසියකු වශයෙන් ඔබට තොරතුරු දැනගැනීමට අයිතියක් ඇත. රටවල් සියයකට (100) අධික සංඛ්‍යාවක පුරවැසියන් ට මෙම අයිතිය ලැබී ඇත්තේය.

**තොරතුරු දැනතැනීමේ අයිතිය නීතියක් වශයෙන් පිළිගත් දකුණු ආසියා රටවල් තිබේද? ඒ කවරේද?**

ඔව්, පකිස්තානය, ඉන්දියාව, නේපාලය සහ බංගලිදේශය යන රටවල් එය නීතියක් වශයෙන් පිළිගෙන තිබේ. ශ්‍රී ලංකාව, මාලදිවයින සහ භූතානය තවමත් නීතියක් වශයෙන් පිළිගෙන නොමැත්තේය.

**තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වූ පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර තිබේද ?**

- 2002 වසරේ මුල් කාලයේ දී, ජනමාධ්‍ය නියෝජිතයින්, ජනමාධ්‍ය පිළිබඳ විශේෂඥයින්, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තු නියෝජිතයින්, සහ අධිකරණ අමාත්‍යාංශ සහ නීති කෙටුම්පත් නිලධාරීන් සහ නීතිපතිවරයාද ඇතුළත්ව අගමැතිගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් විසින් 'තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත' කෙටුම්පත් කෙරිණ. 2004 වසරේ දී ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමතිය ලැබුනද. එම අවස්ථාවේ දී පාර්ලිමේන්තුව විසුරුවාහැරීම නිසා පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරණි.
- අධිකරණ ඇමතිවරයා 2010 මුල් කාලයේ දී 2004 ගෙටුම්පත සංශෝධන සහිතව ජනාධිපතිට ඉදිරිපත් කළේය.
- සංශෝධනයට ලක්කළ තෝරතුරු දැන ගැනීමේ පනත ජනාතිපති අතේය.

.

ප්‍රඃ තොරතුරු දැනතැනීමේ පනත පිළිබඳ විස්තර මට ලබා ගතහැක්කෙ කොහෙන්ද?
පිඃ ඔබට ඒ පිළිබඳ විස්තර ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයෙන් ලබාගත හැකිය.

අංක 96, කිරුළ පාර, කොළඹ 05
දුරකථන : 011-5353835 ෆැක්ස් : 011-5335500

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute